# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2452/41 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මැදවච්චිය ප්‍රාදේශීය සභාව සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ අංක 05 මහදිවුල්වැව කොට්ඨාසයට තේරී පත්වූ ගල්කැටියේ ගෙදර දුමින්ද කුමාර සුගතපාල අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ අංක 05 මහදිවුල්වැව කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා විජේසිංහගේ නිමල් රූපසිංහ නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මැදවච්චිය ප්‍රාදේශීය සභා තේරීම්භාර නිලධාරි නුවර පක්ෂගේ පිවිතුරු ඉන්දික රවිරාජ් ගුණරත්න වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් විජේසිංහගේ නිමල් රූපසිංහ, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ අංක 05 මහදිවුල්වැව කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත්බව මෙයින් ප්‍රකාශ කරමි.

එන්. පී. පී. අයි. ආර්. ගුණරත්න,
තේරීම්භාර නිලධාරි,
මැදවච්චිය ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 07 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

EOG 09 - 0052

1A - G 45307 — 09 (2025/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*